# 1. ඔබ දන්නවාද ....... ?

- ❖ ඉංග්‍රීසි ජාතිකයින් විසින් ඉන්දියාවේ පූනායි නගරයේ සිට 1873 දී මෙම ක්‍රීඩාව එංගලන්තය වෙත ගෙනගොස් ග්ලෝස්ටෂයර් (Gloucestershire) ප්‍රාන්තයේ බැඩ්මින්ටන් නැමැති ස්ථානයේදී ක්‍රීඩාකිරීම නිසා එතැන් පටන් මෙම ක්‍රීඩාවේ නම <u>**බැඩ්මින්ටන්**</u> යනුවෙන් නම් කරන ලදී.

- ❖ එංගලන්තයේ ඉහත කී ප්‍රාන්තය තුල පිහිටා ඇති ජාත්‍යන්තර බැඩ්මින්ටන් ෆෙඩරේෂනය (IBF) 1934දී ආරම්භවූ අතර වර්තමානයේ බැඩ්මින්ටන් ලෝක ෆෙඩරේෂනය (BWF) ලෙස හැඳුන්වනු ලබන එම ආයතනය මගින් ලෝකය පුරා රටවල් 159ක් තුල බැඩ්මින්ටන් ක්‍රීඩාව පාලනය කරනු ලබයි. අප රටෙහි මව් සංගමය වන ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමය (SLBA), 1950 ආරම්භ වුන අතර එංගලන්තයේ BWF ආයතනයට හා බැඩ්මින්ටන් ආසියානු කොන්ෆෙඩරේෂනය (BAC) සමග අනුබද්ධ සංවිධානයකි. සමස්ත ලංකා පාසැල් බැඩ්මින්ටන් තරඟ පිළිබඳ පරිපාලන කටයුතු මෙහෙයවන ශ්‍රී ලංකා පාසැල් බැඩ්මින්ටන් සංගමය (SLSBA), 1970 ආරම්භ වූ අතර එය මව් සංගමයට අනුබද්ධ ආයතනයකි.

- ❖ 1954 වසරේදී අම්බලන්ගොඩ ධර්මාශෝක විදුහලේ බැඩ්මින්ටන් ක්‍රීඩා සමාජයක් ආරම්භ කරමින් ශ්‍රී ලංකාවේ බැඩ්මින්ටන් ක්‍රීඩාව සංවර්ධනය හා ප්‍රවර්ධනයට මහත් මෙහෙයවරක් කල නැසීගිය ආරියදාස සිල්වා මහතාගේ මඟ පෙන්වීම යටතේ 1970 දී ශ්‍රී ලංකා පාසැල් බැඩ්මින්ටන් සංගමය පිහිටුවා ගන්නා ලදී. 1970 සිට 1980 දක්වා එතුමා එහි ප්‍රධාන ලේකම් වශයෙන් කටයුතු කල අතර. ශ්‍රී ලංකා බැඩ්මින්ටන් සංගමයට සම්බන්ධවීමෙන් පසුව පිට පලාත්වල බැඩ්මින්ටන් සංගම් පිහිටුවා, බැඩ්මින්ටන් ක්‍රීඩාව ශ්‍රී ලංකාව පුරා ප්‍රචලිතවීමට අඩිතාලමක් දමන ලදී.

- ❖ 1992 දී ස්පාඤ්ඤයේ බාසිලෝනාහි පැවැත්වූ ඔලිම්පික් ක්‍රීඩා උළෙල සඳහා ප්‍රථම වරට පිලිගත් ක්‍රීඩාවක් වශයෙන් බැඩ්මින්ටන් ක්‍රීඩාව ඇතුලත් කර ගන්නා ලදී.

- ❖ ලෝකයේ පලමු පෙලේ කණ්ඩායම් ශූරතාවලිය ලෙස (පිරිමින් සඳහා) තෝමස් කුසලානය (Thomas Cup) හා කාන්තාවන් සඳහා උබර් (Uber Cup) ශූරතාවලිය සැලකේ. මීට අමතරව ආසියානු ක්‍රීඩා උළෙල (Asian Games) පොදු රාජ්‍ය මණ්ඩල ක්‍රීඩා උළෙල සඳහා ද බැඩ්මින්ටන් ඇතුලත් කර ඇත.

- ❖ චීනය, ඉන්දුනීසියාව, කොරියාව, මලයාසියාව වැනි ආසියානු රටවල් සහ ඩෙන්මාර්කය එංගලන්තය වැනි යුරෝපා රටවල් මෑත කාලයේදී ලෝක ශූරතාවයන් වැඩි ප්‍රමාණයක් හිමිකර ගත් රටවල් වේ.

- ❖ ලෝකයේ පිති (rackets) වලින් ක්‍රීඩාකරන වේගවත් ම ක්‍රීඩාව ලෙස බැඩ්මින්ටන් ක්‍රීඩාව පිලිගැනේ.. (fastest racket game in the world)

- ❖ බැඩ්මින්ටන් තරඟයකදී සාමාන්‍යයෙන් එක් ක්‍රිඩකයෙක් ක්‍රීඩා පිටිය තුල සැතපුම් 1 පමණ දුරක් දිවයන බව සොයාගෙන ඇත.

- ❖ ජාත්‍යන්තර තත්ත්වයේ ගෘහස්ත ක්‍රීඩාගාරයක ක්‍රීඩා පිටියේ සිට වහලය දක්වා <u>**අවම උස**</u> 12 m විය යුතුය. ( එහෙත් සාමාන්‍ය තත්ත්වයේදී මෙම උස 9 m වශයෙන්ද සලකනු ලැබේ.)

- ❖ ක්‍රීඩාපිටිය (court) 13.40 m X 6.10 m (44’ X 20’) සෘජුකෝණාස්‍රයක් වන අතර සීමාඉරි (lines) වල පලල 40 mm (1.5”) විය යුතුය. (ක්‍රීඩා පිටියේ ඇතුලත් සම්පූර්ණ සීමා ඉරි දැක්වෙන රූප සටහනක් 21 පිටුවේ සඳහන් කර ඇත.)

- ❖ පිටියේ කනු (Post) බිම සිට 1.55 m (5’ 1”) උඩින් සකස්කර තිබිය යුතු අතර එම උසට ම සරිලන ලෙස දැල (Net) සකස් කරගත යුතුය.

- ❖ ෂටල්කොක් (shuttlecock) පිහාටු වලින් සහ කෘත්‍රිම ද්‍රව්‍ය (උදා: නයිලෝන්) වලින් සාදනු ලැබේ. සාමාන්‍යයෙන් පිහාටු 16 ක් ඇති අතර බර 4.74 g සිට 5.50 g අතර අගයක් ගනියි. පාත්තයන්ගේ තටුවලින් පිහාටු ලබාගෙන ෂටල්කොක් නිෂ්පාදනය කරයි. පාසැල් තරඟාවලි වලදී (මුල් පෙලේ තරඟවලදී **හැර – A Division)** අනිකුත් තරඟවලදී භාවිතා කරන්නේ නයිලොන් වලින් සාදන ෂටල්කොක්ය.

- ❖ බැඩ්මින්ටන් පිත්ත (Racket) නිෂ්පාදනය කිරීම හා සම්බන්ධ තාක්ෂණය සීඝ්‍ර වශයෙන් වැඩි දියුණු වෙමින් පවතී. මුලදී ලී වලින් ආරම්භවී, වානේ, ඇලුමිනියම් මිශ්‍ර සැහැල්ලු ලෝහ සිට කාබන් ග්‍රැපයිට් හා නැනෝ තාක්ෂණය ඔස්සේ නිපදවෙන බැඩ්මින්ටන් පිති දක්වා වර්ධනය වී ඇත. බැඩ්මින්ටන් ක්‍රීඩකයෙකුගේ දක්ෂතාවයන් ගෙන් වැඩි කොටසකට දායක වන්නේ බැඩ්මින්ටන් පිත්තයි. එබැවින් බැඩ්මින්ටන් ක්‍රීඩකයාගේ හොඳම මිතුරා වශයෙන් බැඩ්මින්ටන් පිත්තට සුවිශේෂ ස්ථානයක් හිමිවේ. බැඩ්මින්ටන් පිත්තක දිග 680 mm ( 2’ 2 ¾”) සහ පලල 230 mm (9”) වැඩි නොවිය යුතුය.

- ❖ IBF ආයතනය මඟින් 2006 දී සිදුකල සංශෝධන අනුව බැඩ්මින්ටන් තරඟයක (match) **<u>ඕනෑම තරඟවාර (games) දෙකක් අතර</u>** තත්පර 120 ක විවේක කාලයක් හිමිවේ. මෙයට අමතරව තරඟවාරයකදී එක් පිලක් ලකුණු 11 ලබාගත් පසුව තත්පර 60 ක විවේක කාලයක් හිමිවේ.

- ❖ කාන්තා කේවල, කාන්තා යුගල, පිරිමි කේවල, පිරිමි යුගල සහ මිශ්‍ර යුගල තරඟවල (match) එක් තරඟ වාරයක් (a game) සාමාන්‍යයෙන් <u>ලකුණු 21</u> දී අවසන්වේ. දෙපිලේ ලකුණු තත්ත්වය <u>20 සමවූ</u> විට <u>පලමුවෙන්ම</u> අනෙක් පිලට වඩා ලකුණු 02ක් ඉදිරියට පැමිනෙන පිලට ජයග්‍රහණය හිමිවෙයි. එසේ වුවත් තරඟයක් දීර්ඝ කල හැකි උපරිම ලකුණු ගනන 30කි. දෙපිලේ ලකුණු තත්ත්වය <u>29 සමවූ</u> විට ඊලඟ ලකුණ (30 වන ලකුණ) ලබන පිලට ජයග්‍රහණය හිමිවෙයි.